## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
## ලෝක වනජීවී දිනය - 2025 සැමරුම් වැඩසටහන

**මාර්තු මස 03 වන දින ලෝක වනජීවී දිනය සැමරීම නිමිත්තෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විදුසර පුවත්පතේ මාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් දීප ව්‍යාප්තව පවත්වනු ලබන ලෝක වනජීවී දින කාටුන් චිත්‍ර හා කෙටි වීඩියෝ චිත්‍රපට තරගාවලිය.**

ලෝකයේ වඳවීමේ තර්ජනයට ලක්වී ඇති ජීවී විශේෂයන්ගේ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියට (CITES ) වසර 40ක් සපිරීම නිමිත්තෙන් 2013 වර්ෂයේ දී CITES සම්මුතියේ පාර්ශවීය රටවල සහභාගීත්වයෙන් බැංකොක් නුවර පැවැති සමුළුවේදී සිදුකළ යෝජනාවකට අනුව ලෝකයේ වඳවීමේ තර්ජනයට මුහුණ පා සිටින වනජීවීන් වෙනුවෙන් අන්තර්ජාතික දිනයක් ප්‍රකාශයට පත් කිරීමට තිරණය කෙරිණි. ඒ අනුව ලෝකයේ වඳවීමේ තර්ජනයට ලක්වී ඇති ජීවී විශේෂයන්ගේ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියට(CITES ) අත්සන් තැබූ 1973 මාර්තු 03 වන දිනය සිහිගන්වමින් මාර්තු 03 "ලෝක වනජීවී දිනය" ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නිත්‍ය වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි.

මෙවර 2025 ලෝක වනජීවී දින තේමාව වන "වනජීවී සංරක්ෂණය මිනිසා සහ පෘථිවියේ අනාගත ආයෝජනයයි" ( Wildlife Conservation Finance Investing in People and Planet) මූලික කරගෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව සහ පාසල් සිසුන් වනජීවී සංරක්ෂණ ක්‍රියාවලියට දායක කර ගැනීමේ අරමුණින් දීප ව්‍යාප්ත සමරු වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. ඒ අනුව වනජීවී සංරක්ෂණය අලලා කාටූන් චිත්‍ර තරගයක් සහ කෙටි වීඩියෝ චිත්‍රපට තරගයක් පාසල් මට්ටමින් සහ විවෘත වශයෙන් පැවැත්වීමට තිරණය කර ඇත.

| අනු අංකය | තරගය | තරගයේ ස්වභාවය | පවත්වනු ලබන කාණ්ඩයන් | ජයග්‍රාහකයින් තෝරාගැනීම |
|---|---|---|---|---|
| 01 | වනජීවී කාටුන් චිත්‍ර තරගය | ඉහත තේමාවට අදාළව කාටුන් චිත්‍ර තරගය සඳහා ඩිජිටල් මාධ්‍යයෙන් හෝ අතින් අඳින ලද කාටුන් චිත්‍ර ලෙස ඕනෑම ආකාරයක නිර්මාණ ඉදිරිපත් කළ හැකිය. | විවෘත -<br>(ශ්‍රී ලාංකික ඕනෑම පුරවැසියෙකුට මේ සඳහා ඉදිරිපත් විය හැකිය)<br><br>පාසල් -<br>1වන කාණ්ඩය - 6,7,8 ශ්‍රේණි<br>2 වන කාණ්ඩය - 9,10,11 ශ්‍රේණි<br>3 වන කාණ්ඩය - 12,13 ශ්‍රේණි | සුදුසුකම් සහිත පළපුරුදු විනිශ්චය මණ්ඩලයක් යටතේ ජයග්‍රාහකයින් තෝරාගනු ලැබේ. ජයග්‍රාහකයින් සඳහා<br>1 ස්ථානයට රු. 25000.00<br>2 ස්ථානයට රු. 20000.00<br>3 ස්ථානයට රු. 15000.00<br>බැගින් මුදල් ත්‍යාග සහ වටිනා සහතික පත්‍ර හිමි වේ. මීට අමතරව කුසලතා සහතිකපත් හිමිකරගන්නා ජයග්‍රාහකයින් 10 දෙනෙකු සඳහා රු 5000.00 බැගින් මුදල් ත්‍යාග ලබාදේ |

| | | | | |
|---|---|---|---|---|
| 02 | කෙටි වීඩියෝ චිත්‍රපට තරගය | කෙටි වීඩියෝ චිත්‍රපටයේ උපරිමය විනාඩි 3කට නොවැඩි විනාඩි 1 1/2 ට නොඅඩු පරිදි නිර්මාණ යොමු කළ යුතු වේ. | විවෘත - (ශ්‍රී ලාංකික ඕනෑම පුරවැසියෙකුට මේ සඳහා ඉදිරිපත් විය හැකිය)<br><br>පාසල් -<br>1වන කාණ්ඩය - 6,7,8 ශ්‍රේණි<br>2 වන කාණ්ඩය - 9,10,11 ශ්‍රේණි<br>3 වන කාණ්ඩය - 12,13 ශ්‍රේණි | සුදුසුකම් සහිත පළපුරුදු විනිශ්චය මණ්ඩලයක් යටතේ ජයග්‍රාහකයින් තෝරාගනු ලැබේ. ජයග්‍රාහකයින් සඳහා<br>1 ස්ථානයට රු. 25000.00<br>2 ස්ථානයට රු. 20000.00<br>3 ස්ථානයට රු. 15000.00<br>බැගින් මුදල් ත්‍යාග සහ වටිනා සහතික පත්‍ර හිමි වේ. මීට අමතරව කුසලතා සහතිකපත් හිමිකරගන්නා ජයග්‍රාහකයින් 10 දෙනෙකු සඳහා රු 5000.00 බැගින් මුදල් ත්‍යාග ලබාදේ) |

කාටූන් චිත්‍රපටයට අදාළ තරග කොන්දේසි

- "වනජීවී සංරක්ෂණය මිනිසා සහ පෘථිවියේ අනාගත ආයෝජනයයි" යන තේමාව යටතේ ඩිජිටල් කාටූන් චිත්‍රය හෝ අතින් නිර්මාණය කරන ලද කාටූන් චිත්‍රය 12" x 18" ප්‍රමාණයෙන් ඉදිරිපත් කළ යුතු වේ.
- ඩිජිටල් මාධ්‍යයෙන් සිදුකරන චිත්‍රයේ වර්ණ ගැන්වීමට පෙර අඳිනු ලබන චිත්‍රය ද එවිය යුතුය.
- මුල් නිර්මාණය ස්කෑන් කොට හෝ වෘත්තීය මට්ටමේ කැමරාවකින් නියමිත ආකාරයට පිටපත් කොට ඉදිරිපත් කළ යුතු ය. (දුර්වල කැමරා පිටපත් භාර ගනු නොලැබේ.) ඉදිරිපත් කරන චිත්‍රයේ පිටපත උපරිම පළල පික්සල් 1920කට සීමා කොට සකසා, JPG ගොනුවක් ලෙසින් ඉදිරිපත් කළ යුතු ය.

කෙටි චිත්‍රපටයට අදාළ තරග කොන්දේසි -:

- "වනජීවී සංරක්ෂණය මිනිසා සහ පෘථිවියේ අනාගත ආයෝජනයයි" යන ලෝක වනජීවී දින තේමාව යටතේ කෙටි චිත්‍රපටය නිර්මාණය කළ යුතු ය.
- කෙටි චිත්‍රපටයේ කාලය විනාඩි 3කට නොවැඩි විනාඩි 1 1/2 ට නොඅඩු විය යුතුය.
- කථනයත් සංගීතයත් යොදා ගත හැකිය.
- ආකෘති සහ Animation භාවිතා නොකළ යුතුය.
- භාෂා ත්‍රිත්වයෙන්ම නිර්මාණය සිදු කළ හැකිය. දමිළ භාෂාවෙන් සිදුකරන නිර්මාණ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් උප සිරැසි යෙදිය යුතුය.
- ජංගම දුරකථනයෙන් හෝ කෙටි චිත්‍රපටය නිර්මාණය කළ හැකිය.

පොදු තරග කොන්දේසි-:

මෙම තරගයට ඉදිරිපත් විය හැක්කේ ශ්‍රී ලාංකික පුරවැසියන්ට පමණි.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ , Department of Wildlife Conservation, Sri lanka නිල ෆේස්බුක් පිටුවෙහි පළ කරන ලද අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර ඔබ විසින් නිර්මාණය කරන චිත්‍රය සමඟ පහත දැක්වෙන ලිපිනයට හෝ wildlifeday2025@gmail.com විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය.

- තරග වෙනුවෙන් ඉදිරිපත් කරන නිර්මාණ සඳහා Artificial intelligence තාක්ෂණය භාවිතා නොකළ යුතුය.
- ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණය සපුරා ම ඔබේ නිර්මාණයක් ම විය යුතු ය. අන්තර්ජාලයෙන් හෝ වෙනත් මාධ්‍යයකින් උපුටාගත් කොටස් කිසිවක් ඊට එකතු කර නොතිබිය යුතු ය. එසේ සැක සහිත නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- පාසල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණය තම පන්තියේ ඉගෙනීම ලබන ශිෂ්‍ය/ශිෂ්‍යාවක් බවට විෂයය භාර/පන්ති භාර ගුරු භවතා වෙතින් තහවුරු කර තිබිය යුතුය.
- එක් අයදුම්කරුවකුට එක් තරග අංශයකින් එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ හැකිය.
- ජයග්‍රාහී නිර්මාණ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර එහි අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුය.
- අන්වර්ථ නම්වලින් කිසිදු අයදම්කරුවෙකුට තරගයට නිර්මාණ ඉදිරිපත් කළ නොහැක.
- තරගයට ඉදිරිපත්වීම තරග කොන්දේසිවලට එකඟ වීමක් සේ සැලකෙන අතර, ඉහත තරග කොන්දේසි කඩ කරන ඕනෑ ම නිර්මාණයක් විනිශ්චයකින් තොරව ම ඉවත් කිරීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතු වේ.
- මෙම තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්මාණ නැතිවීම, හානි වීම හෝ ප්‍රමාද වීම හා නිවැරදි ලෙස විද්‍යුත් තැපැල මගින් යොමු නොකිරීමෙන් ඇති වන ගැටලු සම්බන්ධයෙන් සංවිධායක මණ්ඩලය විසින් වග කියනු නො ලැබේ.
- ඉහත තරග කොන්දේසිවලට පටහැනිව ක්‍රියා කිරීම, අසම්පූර්ණ අයදුම්පත් එවීම හෝ ප්‍රමාද වී අයදුම් කිරීම නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.
- ඉහත තරග විනිශ්චය අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් විසින් සිදු කරන අතර එම විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

නිර්මාණ ඉදිරිපත් කිරීම -:

I. මෙම නිර්මාණ භාර ගනු ලබන අවසන් දිනය 2025.02.17 දින වේ. එදින පැය 23.59 න් පසු ලැබෙන නිර්මාණ භාර ගනු නොලැබේ.
II. ඔබ විසින් අප වෙත එවනු ලබන සියළු නිර්මාණ හා අයදුම් පත්‍රය ඊ-මේල් පණිවුඩයක් මගින් wildlifeday2025@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතුය. එසේ එවන ඊ-මේල් පණිවුඩයෙහි මාතෘකාව වශයෙන් වනජීවී කෙටි චිත්‍රපට තරගය ද වනජීවී කාටූන් චිත්‍ර තරගය ද යන්න ලෙස දැක්විය යුතු ය. ඒ සඳහා පිළිතුරු පණිවුඩයක් ඊ-මේල් මගින් ආපසු දන්වනු ලබන අතර එසේ නොලැබුනහොත් පහතින් දක්වා ඇති දුරකථන අංක වෙතින් විමසීම් සිදු කල හැකි ය.
III. තරගය පිළිබඳව වැඩිදුර තොරතුරු පහත දුරකථන අංකය මගින් ලබා ගත හැක.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව : 011 – 2888585 (ප්‍රචාරක ඒකකය) දිගු අංකය 683

තැපෑලෙන් එවන නිර්මාණ පහත සඳහන් ලිපිනයට යොමු කළ හැකිය. ලිපි කවරයේ ඉහළ වම්පස තරගයේ නම සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අංක 811/A, ජයන්තිපුර පාර, බත්තරමුල්ල

ආදර්ශ අයදුම්පත

ලෝක වනජීවී දිනය - 2025 සැමරුම් වැඩසටහන

මාර්තු මස 03 දින ලෝක වනජීවී දිනය සැමරීම නිමිත්තෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කාටූන් චිත්‍ර තරගය හා කෙටි වීඩියෝ චිත්‍රපට තරගාවලිය. (අදාළ කොටස පමණක් සම්පූර්ණ කරන්න)

1. තරගයේ නම :- ..........................................................................
2. i. තරගකරුගේ නම :- ..........................................................................
   ii. ඉංග්‍රීසි භාෂාවෙන් :- ..........................................................................
3. i. පෞද්ගලික ලිපිනය :- ..........................................................................
   ii.ඉංග්‍රීසි භාෂාවෙන් :- ..........................................................................
   iii.දුරකථන අංකය :- ස්ථාවර............................ජංගම ...............................
4. ජාතික හැඳුනුම්පත් අංකය (පාසල් සිසුන්ට ඇත්නම් පමණක්) :-..........................................
5. ස්ත්‍රී /පුරුෂ භාවය :- ..........................................................................
6. උපන් දිනය :- ..........................................................................
7. උපන් දිනය :- ..........................................................................
8. i. පාසලේ නම :- ..........................................................................
   ii. ඉංග්‍රීසි භාෂාවෙන් :- ..........................................................................
   iii.පාසලේ නම :- ..........................................................................
   iv. දුරකථන අංකය :- ..........................................................................
9. ශ්‍රේණිය :- ..........................................................................
10. තරගයේ කාණ්ඩය :- ..........................................................................

මෙම නිර්මාණය මාගේ නිර්මාණයක් බවත් මෙහි සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් තරගය සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇති සියළුම නීති රීතිවලට එකඟ වන බවත් ,ජයග්‍රාහී නිර්මාණ වාණිජ්‍ය පදනමින් නොවන සංරක්ෂණ කටයුතු හා අධ්‍යාපන කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මාධ්‍ය අනුගහය ලබාදෙන ආයතන විසින් ප්‍රදර්ශනය කිරීම පිළිබඳව මා එකඟ වන බවත් සහතික වෙමි.

දිනය : - .......................................... අත්සන : - ..........................................

අංශ භාර / පන්ති භාර ගුරු භවතාගේ නිර්දේශය

මේ සමඟ එවා ඇති කාටූන් චිත්‍රය/ කෙටි වීඩියෝ චිත්‍රපටය මෙම පාසලෙහි ....................................... ශ්‍රේණියෙ හි ඉගෙනුම ලබන ......................................................... ශිෂ්‍යයා /ශිෂ්‍යාවගේ ස්වාධීන නිර්මාණයක් බවට සහතික කරමි.

නම :-.........................................................................................

අත්සන :-.........................................................................................

දිනය :-.........................................................................................